# බුද්ධ ධර්මය

## 1 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 17 පාඩම
# උතුම් මවුපියෝ



මේ පාඩම්වලින් ඔබේ දරුවාට යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය පදනම ලබාදීමට අපේක්ෂා කෙරේ.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෘ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

**දෙමව්පියනි/වැඩිහිටියනි,**

බුද්ධ ධර්මය 1 ශ්‍රේණිය පෙළ පොත භාවිත කරමින් දරුවා මෙම ක්‍රියාකාරකම් වල නිරත කරවන්න. දුෂ්කරතා දැක්වුවහොත් දරුවාට උදව් කරන්න.

## ක්‍රියාකාරකම 1

- පෙළපොත 17 පාඩමේ 35 පිටුවේ,
  - ✓ අම්මාට වඳින ගාථාව ශබ්ද නඟා කියන්න.
  - ✓ තාත්තාට වඳින ගාථාව ශබ්ද නඟා කියන්න.
  - ✓ දිනපතා උදේ සවස අම්මාට, තාත්තාට,ගෙදර සිටින වැඩිහිටියන්ට වැඳීම පුරුද්දක් කරගන්න. ගරු කරන්න පුරුදුවෙන්න.
- අම්මාට කළ උදව්වක් හා තාත්තාට කළ උදව්වක් දැක්වෙන චිත්‍රයක් අඳින්න.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ආදරයයි කරුණාවයි
  හිනා ගොඩයි තැගි කරයි
  හිස අත ගා පුතේ කියයි
  මගේ පියා රජෙක් තමයි

යන කවිය ගායනා කරන්න. පාසල ආරම්භ වූ පසු ඔබේ පන්ති කාමර වේදිකාවේ දී ගයන්න.

## ක්‍රියාකාරකම 2

1. "රාහුල පොඩි හාමුදුරුවෝ" යන පාඩම මතක් කරගන්න.

2. රාහුල පොඩි හාමුදුරුවෝ වැලි දෝතක් ගෙන අහසට විසි කර පතන්නේ කුමක් ද? නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

   a. වැලි දෝත අහසේ ඈතට පාවී යාමට සැලසේවා!

   b. මේ වැලි කැට ගණනට මට අවවාද ලැබේවා!

3. රාහුල පොඩි හාමුදුරුවන් ගැන ඉගෙනගත් බොදු කවි නැවතත් ගයන්න.

   මෙත් සිසිලෙන් සිත පුරවා
   වැලි දෝතක් ගෙන උඩදා
   වැලි කැට ගණනට සැමදා
   වැඩිහිටි ඔවදන් පැතුවා



Copyright © www.e-thaksalawa.moe.gov.lk

| | |
|---|---|
| රාහුල සමිඳුගෙ | මුහුණේ |
| ප්‍රිය බව නිතරම | රැඳුණේ |
| ශික්ෂාවෙන් අග | තැන්පත් |
| තනතුර සමිඳුට | ලැබුණේ |

හරිම හොඳයි. ✓


Copyright © www.e-thaksalawa.moe.gov.lk